(公財) 佐賀県国際交流協会

සගා ප්‍රාන්තයේ ජාත්‍යන්තර සබඳතා සංගමය

シンハラ語

සගා ප්‍රාන්තයේ ජීවත්වන විදේශිකයන් සඳහා වූ උපදෙස් පත්‍රිකාව

එදිනෙදා ජීවිතය පිළිබඳ ඔබ මුහුණ දෙන ඕනෑම ප්‍රශ්නයක් හෝ නොතේරෙන දෙයක් ඇත්නම් අපිට කතා කරන්න

උපදෙස් ලබාගත හැකි වේලාවන්	උපදෙස් ලබාගත හැකි භාෂාවන්	උපදෙස් ලබා ගත හැකි ස්ථානය
සඳුදා සිට සිකුරාදා දක්වා 9:00-17:00 සෙනසුරාදා ඉරිදා සහ අනෙකුත් නිවාඩු දිනවල වසා ඇත	ජපන් භාෂාව ඉංග්‍රීසි භාෂාව චීන භාෂාව කොරියානු භාෂාව	සගා කෙන් කොකුසයි කෝරියු පුරාසා සගා ෂි ෂිරයම 2-1-12 සගාෂෝ කෝ බිරු 1කයි TEL:0952-22-7830 උපදෙස් ලබාගැනීම සඳහා E-mail:info@spira.or.jp

＊නොමිලේ නීතිමය උපදෙස්:[කලින් දිනයක් වෙන්කර ගැනීම අත්‍යවශ්‍යයි. නමුත් හදිසි අවස්ථාවකදී වුවද අපෙන් උපදෙස් ලබාගත හැකිය]

සගා ලුමිරිය ස්ථානය
ලුමියන හෝල් මධ්‍ය ස්ථානය
ලියන යෝජනා බිරු
ජිනන් පාලම
ජිනන් පාලම
ජිනන් පාලම

සුළිසුළං සහ ගං වතුර

සුළිසුළඟක් ඒමට පෙර කලයුතු දේ

- ගෙදරින් පිටත මිදුලේ හෝ බැල්කනි යේ තබා ඇති දේවල් බඳ තැබීම හෝ ගෙතුලට ගන්න
- විදුලිය විසන්ධිවීමට ඉඩ ඇති හෙයින් විදුලි පන්දම් රේඩියෝ වැනි දේවල් සූදානම් කර තබන්න

- ජනෙල් වීදුරු, බිදීයාමට ඉඩ ඇති හෙයින් ටේප් ඇලවීමින් shutter දොරවල් හා කර්ටන් වැසීමටත් අමතක නොකරන්න

- හදිසි ආපදාවක් ඇතිවූ විට පාවිච්චි කිරීමට ප්‍රමාණවත් ආහාර රැස්කර තබාගන්න

- TV , රේඩියෝ වලින් සහයන කාලගුණ වාර්තා වලට සවන් දෙන්න

සුළිසුළඟ කදී

- පිටතට නොයන්න

- මුහුද,ගංගා,ඇලුවිල්, තාය යා හැකි ස්ථාන වලට නොයන්න

- ආපදා ඇතතුරු පිලිබඳ තොරතුරු,වලට අවධානය යොමුකරමින් ඉවත්ව යනලෙස නිර්දේශය කළහොත් එවාම ආරක්ෂිත ස්ථානයකට යන්න

- ආරක්ෂිත ස්ථාන වලට පයින් යනවිට වතුර පිරී ඇති තැන් වලදී පෙෂ්ටුවන් භාවිතා කරමින් අවධානම් ඇත්ද යන්න පිළිබඳව සුපරික්ෂාකාරී වන්න

භූමි කම්පා

ගොඩනැගිල්ලක් තුල සිටින විට

භූමි කම්පාව ඉවර වන තෙක් මේසයක් වැනි යමක් යටට වී ආරක්ෂා වන්න

【 නිවසේදී 】

ගෑස් උදුන් නිවා දමන්න

ජනෙල් දොරවල් ඇර තබන්න (පිටවීම කොහිදැයි තහවුරු කරගන්න)

【 වෙළඳ සැල් සිනමා ශාලා වැනි ස්ථාන වලදී 】

හදිසි පිටවීම කොහිදැයි තහවුරු කරගන්න

ගිස ප්‍රවේශම් කරගන්න

විදුලි සෝපානය පාවිච්චි නොකරන්න

නිලධාරීන්ගේ උපදෙස් වලට අනුවකටයුතු දෙන්න

【 විදුලි සෝපානය තුල දී 】

හදිසි බොත්තම් සමග සියළුම පාවිච්චිවලට අදාළ බොත්තම් තදකර තනරවූ තට්ටුවෙන් පිටවන්න

නිවැරදි තොරතුරු

නිවැරදි තොරතුරු, වලට අනුව ඉවසීමෙන් කටයුතු කරන්න

ගොඩනැගිල්ලකින් පිටත සිටින විට

තම අතැති ගමන්මළු හෝ සුදුසු දෙයක් භාවිතාකර හිස ආරක්ෂා කරගන්න

පටු මාර්ග හා තාප්ප මගහරින්න

මුහුදු ගංගා කඳු අසල සිටිනවානම් හැකිතාක් දුරට ඒවායින් ඈත් වන්න

【 වාහනයක් තුලදී 】

- සෙසෙමින් පාරේ වම් පසින් වාහනය නතර කරන්න
- වාහනයෙන් බැසයනවිට වාහනයේ යතුර දොරේම තබාන්න, වාහනයේ බලපත්‍රය හා අනෙකුත් වටිනා දේවල් රැගෙනයාමට අමතක නොකරන්න

【 බස් හා දුම්රිය තුලදී 】

බස් හා දුම්රිය නිලධාරීන්ගේ උපදෙස් වලට අනුව කටයුතු කරන්න

සුනාමි අවස්ථාවකදී

① විශාල භූමි කම්පාවකට පසු සුනාමි ඇතිවීමේ අවදානමක් ඇත

② කිසිම විටකදී මුහුද හෝ ගංගා අසලට නොයා සිටින්න

③ මුහුදින් හැකිතාක් දුරට ඇතට ගොස් කන්දක් හෝ උස් තැනකට යන්න
සුනාමියක් කීප වතාවක්ම ඇතිමට ඉඩ ඇත

ගිනි ගැනීමකදී

① ඉක්මනින් දැන්වීම
අසල්වැසියන්ට දැන්වීම
119 ට කතාකිරීම

② ඉක්මනින් ගින්දර නිවා දැමීම
ගින්දර ඉතාමත් අඩු මටටමේ පවතිනවිට ගිනිනිවනය හෝ වතුර වලින් ගින්න නිවීමට උත්සහ කරන්න

③ ඉක්මනින් ඉවත්වීයාම
සිවිලිම දක්වා ගින්න පැතිරී ඇතිනම් එවාම ඉවත්ව යන්න
පුළුම ගැනීමේදී දුම් ඇතුළු නොවීම සඳහා තෙත තුවාලක් වැනි දෙයකින් මුව හා නාසය වසාගෙන පහතින් ඉඟමින් ඉවත්ව යන්න

ගිනි නිවනය භාවිතාකරන ආකාරය

① ආරක්ෂිත ඇණය ගලවන්න

② ගින්දර ඇති දෙසට නොසලය හරවන්න

③ ලිවරය ඉතා තදින් තද කරන්න

ප්‍රයෝජනවත් ජපන් භාෂාව

わたし の なまえ は ○○ です。 වතාෂිනෝ නමළු එ. . . . . දෙස්	මගේ නම .....
でんわばんごう は ○○ です。 වතාෂිනෝ දෙන්වබන්ගොව් . . . . දෙස්	මගේ දුරකථන අංකය.....
ばしょ は ○○ です。 බශෝ එ . . . . . දෙස්	මම ඉන්නේ .....
○○は なんですか？ . . . . . එ නන් දෙස් ක ?	.....ක මොකක්ද?
○○は いつですか？ . . . . . එ ඉන්සු දෙස් ක ?	.....කවිදෑ?
いくら ですか？ ඉකුරා දෙස්කා?	මිල කීයද?
○○ が ほしい です。 . . . . . ග හොෂි දෙස්	මට ..... අවශ්‍යයි
どうしたら いいですか？ දෝ ශිතරා ඊ දෙස් ක ?	මම කුමක් කලයුතුද?
○○が あります。/○○が ありません。 .....ග අරිමස් /.....ග අරිමසෙන්	..... තියෙනවා /..... නැත

~は どこ ですか？
~එ දොකෝ දෙස් ක ? ~ඇත්තේ කොහේද ?

~が 痛いです。
~.....ග ඉතයි දෙස් මගේ ~ රිදෙනවා

場所	බශෝ	ස්ථාන
市役所	යියකුශෝ	නගර ශාලාව
保健所	හොෂකෙන්ජෝ	මහජන සෞඛ්‍ය මධ්‍යස්ථානය
病院	බියෝයින්	රෝහල
入国管理局	නියුකොකු කන්රි කියොකු	ආගමන විගමන කාර්යාලය
駅	එකි	දුම්රිය තැවතුම්පල
スーパー	සුපා	සුපිරි වෙළඳපල
トイレ	තොඉරෙ	වැසිකිලිය
避難所	හිනන්බශෝ	ආරක්ෂිත ස්ථානය

体	කරද	ශරීරය
頭	අතම	හිස
おなか	ඕනක	බඩ
手	නෙ	අත
足	අයි	කකුල
ここ	කොකො	මෙතැන (යම් ස්ථානයක් පෙන්වීම)

人	හිතෝ	පුද්ගලයන්
父	චිචි	තාත්තා
母	හහ	අම්මා
夫	ඔත්තෝ	ස්වාමිපුරුෂයා
妻	ත්සුම	භාර්යාව
子ども	කොදොමො	දරුවා
女	ඔන්න	ගැහැණිය
男	ඔතොකො	පුරුෂයා

避難所
ආරක්ෂිත ස්ථානයක් යනු.....

1. හදිසි ආපදාවක් නිසා තම නිවෙස විනාශ වීම හෝ එහි ජීවත් වීමට හැකියාවක් නොමැති අවස්ථාවක තාවකාලිකව ජීවත්වීමට ඇති ස්ථානයයි.
2. ඕනෑම පුද්ගලයෙකුට නොමිලයේ තාවකාලිකව ජීවත්වීමට ඇති ස්ථානයයි
3. මෙම ආරක්ෂිත ස්ථානයේදී ජලය කෑම බීම බිලැන්කට් යනාදිය නොමිලයේ ලබාදෙනු ඇත

ආරක්ෂිත ස්ථාන වර්ග	විස්තරය	මා යායුතු ආරක්ෂිත ස්ථාන
しんすいじさんきゅうひなんしせつ 浸水時緊急避難施設 ගංවතුරක් ඇති වූ විට යා යුතු ආරක්ෂිත ස්ථානය	සුනාමියක් හෝ ගංවතුරක් ඇති වූ විට තාවකාලික ආරක්ෂිත ස්ථානයයි	ආරක්ෂිත ස්ථානයේ නම ලිපිනය
していきんきゅうひなんばしょ 指定緊急避難場所 හදිසි අවස්ථාවකදී යාම සඳහා තීරණය කර ඇති ආරක්ෂිත ස්ථානය	හදිසි ආපදාවක් ඇති වූ අවස්ථාවක ආරක්ෂාවීම සඳහා යායුතු ස්ථානයයි	ආරක්ෂිත ස්ථානයේ නම ලිපිනය
していひなんじょ 指定避難所 තීරණය කර ඇති ආරක්ෂිත ස්ථානය	හදිසි ආපදාවක් ඇති වූ විට හෝ ඇති වීමට ඇති අවස්ථාවක පවතින විට තාවකාලිකව ජීවත් වියහැකි ස්ථානයයි. ඇතැම් විට මෙම ස්ථානය තීරණය කර ඇති ආරක්ෂිත ස්ථානය ද විය හැකිය	ආරක්ෂිත ස්ථානයේ නම ලිපිනය

ආරක්ෂිත ස්ථානයේදී.....

1. බොහෝවිට ප්‍රාථමික පාසල් හෝ ද්විතීය පාසල් ප්‍රජා ශාලා යනාදිය හදිසි ආරක්ෂිත ස්ථාන බවට පත්වේ
2. ආපදාව පිලිබඳ වැඩි විස්තර මෙම ස්ථාන වලදී ලබා ගත හැකිය
3. ඉතා විශාල පිරිසක් මෙම ස්ථානයට රැස් වෙන බැවින් සියලුම අය පිළිපැදිය යුතු විවිධ නීති රීති ඇත. සියලුම අය සහයෝගයෙන් ජීවත් වීම අත්‍යවශ්‍ය වේ

උදාහරණයක් ලෙස

- ආරක්ෂිත ස්ථානයේදී පාවහන් ගලවා තැබීම
- කෑම බීම බෙදා දෙන වේලාවන් සහ ළුවාහි ප්‍රමාණයන්
- වැසිකිළි භාවිතය කුණු දමන ආකාරය පිළිබඳ
- ශබ්ද නගා කතා නොකිරීම

මෙම ස්ථානවල ඔබේ එදිනෙදා ජීවන චාරිත්‍ර ආගමික ඇදහීම් යනාදිය පිළිබඳව නොගැලපීම් තිබීමට පුළුවන.
ඔබට නොතේරෙන දෙයක් හෝ කළ නොහැකි දෙයක් ඇත්නම් ආරක්ෂිත ස්ථානයේ අය සමඟ සාකච්ඡා කිරීමට හෝ උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන්න

තමන් ජීවත්වන ප්‍රදේශයේ ආරක්ෂිත ස්ථාන තිබෙන්නේ කොහේද කියා තහවුරු කරගනිමු

佐賀市 危機管理防災課 Saga kikikanri-bousai-ka ☎ 0952-40-7013	小城市 防災対策課 Ogi bousai-taisaku-ka ☎ 0952-37-6119	玄海町 防災安全課 Genkai bousai-anzen-ka ☎ 0955-52-2115
唐津市 危機管理防災課 Karatsu kikikanri-bousai-ka ☎ 0955-72-9260	嬉野市 総務課 Ureshino soumu-ka ☎ 0954-66-9111	有田町 総務課 Arita soumu-ka ☎ 0955-46-2111
鳥栖市 総務課 Tosu soumu-ka ☎ 0942-85-3506	神埼市 防災危機管理課 Kanzaki bousai-kikikanri-ka ☎ 0952-52-1111	大町町 総務課 Omachi soumu-ka ☎ 0952-82-3111
多久市 防災安全課 Taku bousai-anzen-ka ☎ 0952-75-2181	吉野ヶ里町 総務課 Yoshinogari soumu-ka ☎ 0952-37-0330	江北町 総務政策課 Kouhoku soumu-seisaku-ka ☎ 0952-86-2111
伊万里市 防災危機管理課 Imari bousai-kikikanri-ka ☎ 0955-23-2130	基山町 総務課 Kiyama soumu-ka ☎ 0942-92-7915	白石町 総務課 Shiroishi soumu-ka ☎ 0952-84-7111
武雄市 防災・減災課 Takeo bousai-gensai-ka ☎ 0954-23-9223	上峰町 総務課 Kamimine soumu-ka ☎ 0952-52-2181	太良町 総務課 Tara soumu-ka ☎ 0954-67-0129
鹿島市 総務課 Kashima soumu-ka ☎ 0954-63-2112	みやき町 総務課 Miyaki soumu-ka ☎ 0942-89-1651	

හදිසි අවස්ථාවක් ඇති වූ විට ප්‍රයෝජනයට ගැනීම සඳහා කලින් රැස්කර තබා ගත යුතු භාණ්ඩ ලැයිස්තුව

පහත සඳහන් භාණ්ඩ අඩුම තරමින් දින තුනකටවත් ප්‍රමාණවත් ප්‍රමාණයක් රැස්කර තබා ගනිමු

පෙර සූදානම ඉතා වැදගත් වේ

වතුර.කෑම වර්ග

වියලි පාන් වින් මාලු වැනි පිසීමකින් තොරව කෑමට ගත හැකි ආහාර වර්ග

වොකලව් බිස්කට් වැනි ඉඩි කැලරි ආහාර වර්ග

තනි පුද්ගලයෙකුට දිනකට බීමට අවශ්‍ය ජලය ලීටර් තුනක් පමණ

හදිසියක දී අවශ්‍ය අත්‍යවශ්‍ය භාණ්ඩ

- ප්‍රථමාධාර කට්ටලයක්
- ඒදිකතාදා භාවිතා කරනු ලබන බෙහෙත්

රේඩියෝ සහ විදුලි පන්දම්

- FM/AM කාලීකා වලට අසුබලිකන් දිය හැකි රේඩියෝ
- විදුලි පන්දම් (හැකිනම් එක් අයෙකුට එකක් බැගින්)
- බැටරි

ඇඳුම් හා අනෙකුත් දෛනික අවශ්‍යතා

යට ඇඳුම්, කමිස, තුවා, සපත්තු, මේස්, ලිපිමිට අවශ්‍ය පෙන් පැන්සල් කඩදාසි වැනි දේවල් වැනි කබා, ලොකීලිට් ප්ලේට්, අත් මේස්, කරදි සේදීමට අවශ්‍ය සබන්, භාවිතා කර ඉවත දමිය හැකි "කයිරෝ", ගිනිපෙට්ටි, ලයිටර්, ඉලිපන්දම්, හෙල්මට්, ගිනි වැසුම් වැනි දේවල්

මුදල් ඉන්කන් (මුද්‍රාව) සහ බැංකු පොත්

මුදල් (මාරු, කාසි සමෙන)

ඉන්කන් (මුද්‍රාව)

බැංකු පොත්

ATMකාඩ් පත යනාදිය

විදේශ ගමන් බලපත්‍රය සහ ජපන්නේවාසික හැඳුනුම්පත

විදේශ ගමන් බලපත්‍රය, ජපන් නේවාසික හැඳුනුම්පත යනාදිය

ජංගම දුරකථනය සහ චාජරය

- ළදරු කිරි පිරි කිරි බබාතල්, ඩයිපර්, බෝ සහ දරුවා පිළිබඳ නිකුත් කර ඇති සටහන් පොත
- වැඩිහිටියන් භාවිතා කරන ඩයිපර්, ආබාධිත අය සඳහා අවශ්‍ය භාණ්ඩ, බෙහෙත් යනාදිය
- සෞඛ්‍යාරක්ෂණ තුවා
- පොලිතින් බෑග්, පොලිතින් ෂීට්, ඇලුමිනියම් කොදු, පත්තර, ගම් ටේප් වැනි දේවල්